WORKED

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 11,606—1958 දෙසැම්බර් 1 වැනි සඳුද 1.12.1958**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ඇල්.ඩී.—බී. 16/58.

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත**

වර්ෂ 1956 අංක 25, වර්ෂ 1957 අංක 14 සහ වර්ෂ 1957 අංක 62 යන පනත් වලින් සංශොධිත වර්ෂ 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ 40 වන වගන්තියේ (එහි 5 වන උප වගන්තියත් සමග එකට කියැවිය යුතු) (2) වන උප වගන්තියෙන් පැවරී තිබෙන බලයේ ප්‍රකාර කම්කරු, නිවාස සහ සමාජ සේවා ඇමති තුමන් විසින් පනවන ලද නියෝගය යි.

ආර්. ඇම්. ජී. මනිපෙනි,
ස්ථිර ලේකම්වරයා,
කම්කරු, නිවාස සහ සමාජ සේවා අමාත්‍යාංශය.

1958 නොවැම්බර් 7 වන දින,
කොළඹදීය.

**නියෝගය**

ලංකා වතු සේවය ඒකාබද්ධ සංගමයත් ලංකා වතු කාර්‍ය මාණ්ඩලික සමිතියත් අතර එළඹෙන ලදුව වර්ෂ 1958 මාර්තු මස 28 වන දින අංක 11,291 දරන ගැසට් පත්‍රයේ '' 1958 අංක 1 දරන ගිවිසුම '' යන හිසින් පළ කරනු ලැබූ සාමූහික ගිවිසුමෙන් බැඳී නැති ලංකාවේ තේ සහ රබර් වැවීමේ සහ සෑදීමේ කර්මාන්තවල—

(1) අක්කර 100ට නොඅඩු ඕනෑම තේ වත්තක හෝ

(2) අක්කර 200 කට නොඅඩු ඕනෑම රබර් වත්තක හෝ

(3) අක්කර 150 කට නොඅඩු ඕනෑම තේ සහ රබර් වත්තක හෝ සේවයෙහි යොදවා ගෙන සිටින කම්කරුවන්ගේ සෑම සේවායකු—

(අ) එකී ගිවිසුමේ (8) වන වගන්තියෙහි ද එම ගිවිසුමේ උපලේඛනයේ 1 සිට 11 (දෙකම ඇතුළුව) දක්වා වූ වගන්තිවල සහ 13 වන (එහි (ඒ) උප වගන්තියේ තේ වතුවල සහ රබර් වතුවල මූලික ලිපිකරුවන්ගේ වැටුප් ක්‍රමයන් නියම කිරීම සම්බන්ධයෙන් ඒකාබද්ධ මණ්ඩලයේ බලතල වලට අදාල වන කොටස හැර) වගන්තියෙහි ද දක්වෙන නියමයන් හා කොන්දේසි හෝ

(ආ) ඒ නියමයන් හා කොන්දේසිවලට නොදෙවැනි වන නියමයන් හා කොන්දේසි හෝ

අනුව ක්‍රියා කළ යුතුය.

---

ඇල්.ඩී.—බී. 16/58.

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත**

වර්ෂ 1956 අංක 25, වර්ෂ 1957 අංක 14 සහ වර්ෂ 1957 අංක 62 යන පනත් වලින් සංශොධිත වර්ෂ 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ 10 වනවගන්තියේ (එහි 5 වන උපවගන්තියත් සමග එකට කියැවිය යුතු) (2) වන උප වගන්තියෙන් පැවරී තිබෙන බලයේ ප්‍රකාර කම්කරු, නිවාස සහ සමාජ සේවා ඇමතිතුමන් විසින් පනවන ලද නියෝගය යි.

ආර්. ඇම්. ජී. මනිපෙනි,
ස්ථිර ලේකම්වරයා,
කම්කරු, නිවාස සහ සමාජ සේවා අමාත්‍යාංශය.

1958 නොවැම්බර් 7 වන දින,
කොළඹදීය.

3649—ජේ. ඇන්. ආර් 26877—5,270 (11/58)

නියෝගය

ලංකා වතු සේවා ඒකාබද්ධ සංගමයත් ලංකා වතු කාර්‍ය මාණ්ඩලික සමිතියත් අතර එළඹෙන ලදුව වර්ෂ 1958 මාර්තු මස 28 වන දින අංක 11,291 දරන ගැසට් පත්‍රයේ " 1958 අංක 2 දරන ගිවිසුම " යන හිසින් පළ කරනු ලැබූ සාමූහික ගිවිසුමෙන් බැඳී නැති ලංකාවේ තේ සහ රබර් වැවීමේ සහ සැදීමේ කර්මාන්තවල—

(1) අක්කර 100 කට නොඅඩු ඕනෑම තේ වත්තක හෝ

(2) අක්කර 200 කට නොඅඩු ඕනෑම රබර් වත්තක හෝ

(3) අක්කර 150 කට නොඅඩු ඕනෑම තේ සහ රබර් වත්තක හෝ සේවයෙහි යොදවාගෙන සිටින කම්කරුවන්ගේ සෑම සේව්‍යයකු—

(අ) එකී ගිවිසුමේ (8) වන වගන්තියෙහිද එම ගිවිසුමේ උප ලේඛනයේ 1 සිට 11 (දෙකම ඇතුළුව) දක්වා වූ වගන්තිවල සහ 13 වන වගන්තියෙහි ද දක්වෙන නියමයන් හා කොන්දේසි හෝ

(ආ) ඒ නියමයන් හා කොන්දේසිවලට නොදෙවැනි වන නියමයන් හා කොන්දේසි හෝ

අනුව ක්‍රියා කළ යුතුය.

---

ඇල්.ඩී.—බී. 16/58.

**1950 අංක 43 දරණ කාර්මික ආරාවුල් පනත**

වර්ෂ 1956 අංක 25, වර්ෂ 1957 අංක 14 සහ වර්ෂ 1957 අංක 62 යන පනත් වලින් සංශෝධිත වර්ෂ 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ 10 වන වගන්තියේ (එහි 5 වන උප වගන්තියත් සමග එකට කියැවිය යුතු) (2) වන උප වගන්තියෙන් පැවරී තිබෙන බලයේ ප්‍රකාර කම්කරු, නිවාස සහ සමාජ සේවා ඇමති තුමන් විසින් පනවන ලද නියෝගයයි.

ආර්. ඇම්. ජී. මනිපෙනි,
ස්ථිර ලේකම්වරයා,
කම්කරු, නිවාස සහ සමාජ සේවා අමාත්‍යාංශය

1958 නොවැම්බර් මස 7 වන දින,
කොළඹ දීය.

නියෝගය

ලංකා වතු සේවා ඒකාබද්ධ සංගමයත් ලංකා වතු කාර්‍ය මාණ්ඩලික සමිතියත් අතර එළඹෙන ලදුව වර්ෂ 1958 මාර්තු මස 28 වන දින අංක 11,291 දරන ගැසට් පත්‍රයේ " 1958 අංක 3 දරන ගිවිසුම " යන හිසින් පළ කරනු ලැබූ සාමූහික ගිවිසුමෙන් බැඳී නැති ලංකාවේ තේ සහ රබර් වැවීමේ සහ සැදීමේ කර්මාන්ත වල—

(1) අක්කර 100කට නොඅඩු ඕනෑම තේ වත්තක හෝ

(2) අක්කර 200 කට නොඅඩු ඕනෑම රබර් වත්තක හෝ

(3) අක්කර 150 කට නොඅඩු ඕනෑම තේ සහ රබර් වත්තක හෝ සේවයෙහි යොදවාගෙන සිටින කම්කරුවන්ගේ සෑම සේව්‍යයකු—

(අ) එකී ගිවිසුමේ (8) වන වගන්තියෙහිද එම ගිවිසුමේ උපලේඛනයේ 1 සිට 11 (දෙකම ඇතුළුව) දක්වා වූ වගන්තිවල සහ 13 (බී) යන වගන්තියෙහිද දක්වෙන නියමයන් හා කොන්දේසි හෝ

(ආ) ඒ නියමයන් හා කොන්දේසි වලට නොදෙවැනි වන නියමයන් හා කොන්දේසි හෝ

අනුව ක්‍රියා කළ යුතුය.

---

ඇල් ඩී.—බී. 16/58.

**1950 අංක 43 දරණ කාර්මික ආරාවුල් පනත**

වර්ෂ 1956 අංක 25, වර්ෂ 1957 අංක 14 සහ වර්ෂ 1957 අංක 62 යන පනත් වලින් සංශෝධිත වර්ෂ 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ 10 වන වගන්තියේ (එහි 5 වන උප වගන්තියත් සමග එකට කියැවිය යුතු) (2) වන උප වගන්තියෙන් පැවරී තිබෙන බලයේ ප්‍රකාර කම්කරු, නිවාස සහ සමාජ සේවා ඇමති තුමන් විසින් පනවන ලද නියෝගයයි.

ආර්. ඇම්. ජී. මනිපෙනි,
ස්ථිර ලේකම්වරයා,
කම්කරු, නිවාස සහ සමාජ සේවා අමාත්‍යාංශය.

1958 නොවැම්බර් 7 වන දින,
කොළඹ දී ය.

නියෝගය

ලංකා වතු සේවා ඒකාබද්ධ සංගමයත් ලංකා වතු කාර්‍ය මාණ්ඩලික සමිතියත් අතර එළඹෙන ලදුව වර්ෂ 1958 මාර්තු මස 28 වන දින අංක 11,291 දරණ ගැසට් පත්‍රයේ " 1958 අංක 4 දරණ ගිවිසුම " යන හිසින් පළ කරනු ලැබූ සාමූහික ගිවිසුමෙන් බැඳී නැති ලංකාවේ තේ සහ රබර් වැවීමේ සහ සැදීමේ කර්මාන්තවල—

(1) අක්කර 100කට නො අඩු ඕනෑම තේ වත්තක හෝ

(2) අක්කර 200කට නො අඩු ඕනෑම රබර් වත්තක හෝ

(3) අක්කර 150කට නො අඩු ඕනෑම තේ සහ රබර් වත්තක හෝ සේවයෙහි යොදවාගෙන සිටින කම්කරුවන්ගේ සෑම සේව්‍යයකු—

(අ) එකී ගිවිසුමේ (7) වන වගන්තියෙහි ද එම ගිවිසුමේ උප ලේඛනයේ 1 වන (එහි (ඒ) උප වගන්තියේ වතු වල නියුක්ත අනුමත නොකරන ලද දිස්පැන්සරිවරුන්ගේ සහ වෛද්‍ය කාර්‍ය මණ්ඩලයේ සාමාජිකයන්ගේ වැටුප් ක්‍රමයන් නියම කිරීම සම්බන්ධයෙන් ඒකාබද්ධ මණ්ඩලයේ බලතලවලට අදාල වන කොටස හැර) වගන්තියෙහි සහ 2 සිට 11 (දෙකම ඇතුළුව) දක්වා වූ වගන්තිවල ද දක්වෙන නියමයන් හෝ කොන්දේසි හෝ

(ආ) ඒ නියමයන් හා කොන්දේසිවලට නොදෙවැනි වන නියමයන් හා කොන්දේසි හෝ

අනුව ක්‍රියා කළ යුතුය.

---

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.